www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
# Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: Christianity | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

1. ශු. බයිබලයේ පොත් අතරින් පළමු පොත වන්නේ,
   1. ජෙරමියා
   2. උත්පත්ති
   3. නික්මයාම
   4. ගීතාවලිය

2. දේව මැවිල්ලේ හයවන දින මවන ලද්දේ,
   1. පොළව
   2. අහස
   3. මිනිසා
   4. සතුන්

3. දෙවියන් වහන්සේ මිනිසා මවන ලද්දේ,
   1. දෙවියන්වහන්සේගේ ස්වරූපය අනුව
   2. දෙවියන් වහන්සේගේ බලය අනුව
   3. දෙවියන්වහන්සේගේ ශක්තිය අනුව
   4. දෙවියන් වහන්සේගේ කරුණාව අනුව

4. සාගර ජලයේ වඩදිය බාදිය ඇතිවීමට බලපාන දේව මැවිල්ල නම්,
   1. සූර්යයා
   2. තාරකා
   3. ග්‍රහලෝක
   4. චන්ද්‍රයා

5. ජේසු උපත පිළිබඳ සුභ පුවත රැගෙන ආවේ
   1. ලුසිෆර්
   2. ගාබ්‍රියෙල්
   3. ජෝසෙප්
   4. සීමොන්

6. ජේසු උපත පිළිබඳව "රෙදිවලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා ඇති බිලිඳෙක්" පිළිබඳ ලකුණ ලබා දුන්නේ කාහටද ?
   1. පඬිවරුන්ට
   2. රජවරුන්ට
   3. එඬේරුන්ට
   4. අයකැමියන්ට

7. ජේසු කුමා වයස අවු. 12 දී ජෙරුසලම් දේව මාලිගයට ගියේ කුමන මංගල්‍ය සිහිපත් කිරීමටද?
   1. පාස්කු මංගල්‍ය
   2. සති මංගල්‍යය
   3. කූඩාරම් මංගල්‍යය
   4. අස්වැන්න මංගල්‍යය

8. ජේසුස් වහන්සේ කුරුසිපත් වූ දිනය හඳුන්වන්නේ,
   1. පාස්කු ඉරිදා
   2. මහ බ්‍රහස්පතින්දා
   3. මහ සිකුරාදා
   4. පෙන්තකොස්ත ඉරිදා

9. ජේසුස්වහන්සේ කුරුසිය උසුලාගෙන ගිය කපාලපිටිය යන අර්ථය ඇති ස්ථානය වන්නේ,
   1. සීනයි
   2. ගොල්ගොතා
   3. හොරෙබ්
   4. නෙගෙබ්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

10. එම්මාවුස් ගමට ගිය ගෝලයන් අතර එක් අයෙක් වන්නේ,
1. බර්තොලමෙව්
2. තෝමස්
3. ජුදස්
4. ක්ලේයෝපස්

11. "පාපය" යනු
1. දෙමාපියන්ට පිටුපා ක්‍රියා කිරීම
2. දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරීම
3. ගුරුවරුන් පිටුපා ක්‍රියා කිරීම
4. මිතුරන්ගේ කැමැත්තට පිටු පා ක්‍රියා කිරීම

12. සදාකාල ජීවනය උරුමකර ගැනීමට නම්
1. පසුතැවී දෙවිඳුන්ට යාච්ඤා කල යුතුයි
2. තවත් වැරදි නොකළ යුතුයි
3. දේව වචනය කියවා අධ්‍යයනය කළ යුතුයි
4. මේ සියල්ලම

13. උපස්ථායකයින් අතර ප්‍රධානියා වූයේ,
1. ජාකොබ්
2. පේදුරු
3. ස්තේපන්
4. තෝමස්

14. ශ්‍රාවකයින් ශුද්ධාත්ම බලය ලැබූ දිනය හඳුන්වන්නේ
1. පෙන්තකොස්ත මංගල්‍යය
2. පාස්කු මංගල්‍යය
3. කූඩාරම් මංගල්‍යය
4. සති මංගල්‍යය

15. එතියෝපිය ජාතිකයා කියවමින් සිටි දේව වචනය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
1. උත්පත්ති පොත
2. යෙසායාගේ පොත
3. ජෙරමියාගේ පොත
4. නික්මයාම

16. "ජේසුස්වහන්සේගේ සුව කිරීමේ ආශිර්‍වාදය ලැබීමට අප තුළ තිබිය යුතු වන්නේ,
1. බලය
2. නිර්භීතකම
3. ශක්තිය
4. ඇදහිල්ල

17. ජේසුස් වහන්සේගේ පුනරුත්ථානය මුලින්ම අත්දුටු අය වන්නේ
1. මුර සෙබලු
2. ප්‍රේරිතවරු
3. කාන්තාවෝ
4. පරිසිවරු

18. ජේසුස් වහන්සේගේ පුනරුත්ථානය පිළිබඳ පුවත ලද විට සොහොන වෙත ගොස් විමසා බලා විශ්වාස කළ ශ්‍රාවකයා වන්නේ
1. ජාකොබ්
2. පේදුරු
3. ජොහාන්
4. මතෙව්

19. ජේසුස්වහන්සේ කුඩා අවධියේම තම මෙහෙවර පිළිබඳ අවබෝධයෙන් සිටි බවට අනාවරණය වන සිදුවීම වන්නේ,
1. වයස අවුරුදු 12 දී ජෙරුසලම් දේව මාලිගයට යාම
2. කානාහි සරණ මංගල්‍යයට යාම
3. නාසරෙත් ධර්මශාලාවට යාම
4. පාළුකරයට යාම

20. කිතුනු දරුවකු ලෙස ඔබට කළ හැකි වඩාත් යහපත් ක්‍රියාවන් නම්,
1. පාඩම් කිරීම
2. උපකාර කිරීම
3. ක්‍රීඩා කිරීම
4. මිතුරන් බැලීමට යෑම

(ල.2 X 20=40)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

## II පත්‍රය

පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්‍ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් 4 ක් තෝරා පිළිතුරු ලියන්න.

1. අනිවාර්‍යය ප්‍රශ්නය
   1. දේව සබඳතාව පවත්වා ගැනීම සඳහා ඔබ තුළ තිබිය යුතු ගුණාංග 2 ක් ලියන්න
   2. දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මවා ඔවුන් පදිංචි කරවූයේ කොහේද?
   3. ජේසු උපත පිළිබඳව දේවදූත පණිවුඩය ලැබූවන් නම් කරන්න
   4. ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට උපකාර කළේ කවුද?
   5. ජේසුස් වහන්සේ කුරුසිපත් කළ මෙහොතේ හිසට ඉහලින් චෝදනා පත්‍රය ලියා තිබුණි. එහි ලියා තිබුණේ කුමක්ද?
   6. එම්මාවුස් ගමට ගිය ගෝලයෝ නැවත නැගිට ජේසුස්වහන්සේ හඳුනාගත්තේ කුමන ක්‍රියාවකින් පසුද?
   7. එතියෝපීය ජාතිකයාට දේවවචනය පැහැදිලි කළේ කවුද?
   8. ජේසුස් වහන්සේ සුවකළ රෝගීන් දෙදෙනෙකු නම් කරන්න
   9. ජේසුස් වහන්සේ නිහතමානිකම තම ජීවිත ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවක් ලියන්න.
   10. ඔබේ හැකියාවන් දේව ගෞරවය හා මහිමය උදෙසා යොදමින් කටයුතු කළ හැකි අවස්ථාවන් දෙකක් ලියන්න.

(ල. 2X10=20)

2. 1. ස්නාවක ජොහාන්තුමා බෞතීස්මය ලබා දුන් ස්ථානය නම් කරන්න. (ල-2)
   2. ජේසුස් වහන්සේ බෞතීස්ම ලබන මෙහොතේ සිදුවූ විශේෂ සිදුවීමක් ලියන්න. (ල-3)
   3. ඔබතුළ තිබිය යුතු යහපත් කිතුනු ගුණාංග 5 ක් නම් කරන්න. (ල-5)

3. 1. ජේසුස් වහන්සේට පැමිණි පළමු පරීක්ෂාව ලියන්න. (ල-2)
   2. එම පරීක්ෂාවට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුර ලියන්න. (ල-3)
   3. ඔබට පැමිණෙන ජීවිත පරීක්ෂාවන් 5 ක් ලියන්න (ල-5)

4. 1. යහපත් සමාරිතයාගේ උපමාව ජේසුස්වහන්සේ ඉදිරිපත් කළේ කාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ද? එම ප්‍රශ්නය කුමක් ද? (ල-2)
   2. යහපත් සමාරිතයාගේ කථාවේ සමාරීය ජාතිකයා කළ උපකාර 2 ක් ලියන්න. (ල-3)
   3. ඔබට එකිනෙකා වෙනුවෙන් කළ හැකි උපකාර 5 ක් ලියන්න. (ල-5)

5. 1. නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමා කථාවේ එන චරිත 2 ක් නම් කරන්න. (ල-2)
   2. නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමා කථාවේ හරය ඔබගේ වචනයෙන් ඉදිරිපත් කරන්න. (ල-3)
   3. කමාව ලබාගැනීමට ඔබ තුළ තිබිය යුතු ගුණාංග 5 ක් ලියන්න (ල-5)

6. 1. ලාදුරු රෝගින් දස දෙනා අතුරින් ස්තුති කිරීමට කීදෙනෙකු නැවත ජේසුස් වහන්සේ වෙත පැමිණියේ ද? (ල-2)
   2. ස්තුති කිරීම පිණිස පැමිණි අය කුමන ජාතියට අයත් අයද? (ල-3)
   3. ඔබේ මිතුරකු හෝ මිතුරියක රෝගි වූ විට කරනු ලබන යැදුමක් ලියන්න (ල-5)

7. පහත මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.
   1 දේව මැවිල්ල සුරකිමු
   2. එම්මාවුස් ගමන
   3. ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් අපට ලැබී ඇති නව බලාපොරොත්තු
   4. කිතුනු දරුවකු ලෙස ක්‍රියා කරමු.

(ල. 5X2=10)